**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.17 පැය 1645 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/762/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

## "සිරි දළදා වන්දනා - 2025" වාහන කළමණාකරනය හා උපදෙස් පද්ධතිය හඳුන්වා දීම

2025.04.18 වන දින සිට ආරම්භ වන "සිරි දළදා වන්දනාව" නිමිත්තෙන් බැතිමතුන්ගේ ආරක්ෂාව හා රථවාහන හැසිරවීම සඳහා පොලිස් නිලධාරීන් 10,000 කට අධික පිරිසක් රාජකාරී යොදවා සිටියි. "සිරි දළදා වන්දනාව" සඳහා පැමිණෙන බැතිමතුන්ගේ පහසුව සඳහා අවශ්‍ය සේවාවන් සපයා ගැනීම මෙන්ම පොලිසිය සහ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා පොලිසියේ තොරතුරු තාක්ෂණ කොට්ඨාසයේ නිලධාරීන් විසින් නව පද්ධතියක් හඳුන්වා දී තිබේ.

මෙම පද්ධතිය සඳහා ශ්‍රී ලංකා පොලිසියේ නිල විද්‍යුත් ගිණුම හරහා "සිරි දළදා වන්දනාව" නමින් සඳහන් වන (https://daladadekma.police.lk) විද්‍යුත් පිටුව හරහා පිවිසීමෙන් පසු මෙම දළදා වන්දනාව සම්බන්ධයෙන් තොරතුරු හා උපදෙස් බැතිමතුන් වෙත ලබා ගැනිමට හැකියාව ඇත.

මෙම පද්ධතිය හරහා වන්දනා කිරීමට පැමිණෙන බැතිමතුන් හට නගරයේ ඇති රථ ගාල් වලට වාහන යොමු කිරීමට ඇති හැකියාව සම්බන්ධව හා බැතිමතුන් රැඳී සිටින පෝළිම් වල අවසානය සහිත ස්ථානයට ඉතා ආසන්නතම රථ ගාල් පිළිබඳව අවබෝධයක් ලබා ගෙන එම රථගාල් වෙත වාහන යොමු කිරීමට හැකියාව ඇත.තවද මෙම පද්ධතිය රථ ගාල් කලමණාකරණය කරනු ලබන පොලිස් නිලධාරීන් විසින් නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලබන බැවින් රථ ගාල් වල වාහන ගාල් කිරීම සඳහා ඇති ඉඩකඩ පිළිබඳව හා වන්දනාකරුවන් රැඳී සිටින පෝලිම් වල සජීවී තත්ත්වය නිරීක්ෂණය කිරීමට හැකියාව ඇත.

ශ්‍රී ලංකා පොලිසියේ තොරතුරු තාක්ෂණ කොට්ඨාසයේ නිලධාරීන් සහ එක්ව වන්දනාකරුවන්ට සිදුවන අපහසුතාවය මඟහරවා ගනිමින් ඇතිවිය හැකි තදබදය අවම කර ගැනීමට මෙම යෙදුම නිර්මාණය කර ඇත. මෙමඟින් ශ්‍රී දළදා මැදුරේ තේවාවන් පවත්වන වේලාවන්, බැතිමතුන්ගේ පෞද්ගලික ආරක්ෂාව වෙනුවෙන් ගත යුතු පියවර සම්බන්ධ උපදෙස්, වන්දනා කාලය තුල බැතිමතුන් විසින් අනුගමනය කල යුතු උපදෙස් හා දළදා වන්දනාව කල හැකි කාල සීමාවන් සම්බන්ධ සජීවී තොරතුරුද ලබා ගැනීමේ හැකියාව ඇත.

එබැවින් වන්දනාවේ පැමිණෙන බැතිමතුන් ශ්‍රී ලංකා පොලිසියේ නිල විද්‍යුත් ගිණුම හරහා සිරි දළදා වන්දනාවේ යාවත්කාලීන තොරතුරු සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගැනීම තුළින් තම  කාලය ඉතිරි කර ගැනීම හා ඇතිවිය හැකි තදබදය අවම කරගත හැකිය.

පද්ධතියට පිවිසීමට

- www.police.lk පොලිස් වෙබ් අඩවිය වෙත පිවිස “සිරි දළදා වන්දනාව” හෝ https://daladadekma.police.lk භාවිතා කල හැක

.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**